

# දඩයක්කාරයා සහ පරෙවියෝ

(ළමුන් සඳහා වූ ඉන්දියන් කථාවත් ඇසුරෙනි.)

සතුන් හා කුරුල්ලන් දඩයම් කරගෙන නගරයට ගෙන ගොස් ඒවා අධික මිලකට විකුණා ජීවත්වන දඩයක්කාරයෙක් එක් කැලෑවක සිටියේය. මේ අන්දමින් ඔහු ජීවිකාව ගෙන ගියේය.

දිනක් ඔහු ධාරිනී නම් කුඩා පරවියකු අල්ලා ගත්තේය. කුඩා ධාරිනී තමාට ජීවිත දානය දෙන ලෙස දඩයක්කාරයාට කන්නලව් කළද, නපුරු දඩයක්කාරයා ඇය කූඩුවක දමා ගෙන ගියේය.

රෑ බෝවී අඳුර වැටෙන විට තමාට පාර වැරදී ඇතිබවත් රාත්‍රිය කැලෑවේම ගත කිරීමට සිදුවන බවත් දඩයක්කාරයාට අවබෝධ විය. එවිටම වාගේ සීතල සුළඟක් හමා වැස්ස පටන් ගති. දඩයක්කාරයා නොතෙමී සිටීමට ගසක් යටට ගියේය. නමුත් ඔහු වැස්සට තෙමී දිය බේරෙමින් වෙව්ලුවා පමණක් නොව, අධික බඩගින්නක්ද දැනුණි. සීතල නිසා කොතරම් හිරි වැටුනාද යත්, ඔහුට අතපය සෙලවීමට පවා නොහැකි විය. උදව් ඉල්ලා කෑගැසූ නමුත් කිසිම කෙනෙක් ඔහුගේ උදව්වට පැමිණියේ නැත. මෙය ඔහු අටවන තවත් උගුලක් යයි සිතූ සත්තු තව තවත් කැලෑවේ ඈතට ගියෝ ය.

එම ගසේ එක් කරුණාවන්ත පරෙවියෙක් සිටියේය. ඌ ක්‍රිෂ්ණ නම් විය. උගේ භාර්‍යාව ධාරිනී ආපසු එන තුරු බලාපොරොත්තුව සිටි ඌට උදව් ඉල්වා කරන කන්නලව්ව ඇසුනි. දඩයක්කාරයාට උදව් කිරීමට තීරණය කළ පරෙවියා ගසින් බිමට බසිත්ම කූඩුවක දමා ගෙන සිටින තම දයාබර ධාරිනී දුටුවේය. මෙය දඩයක්කාරයා ගේ වැඩක් බව තේරුම් ගත් නමුත් උදව් කිරීමට ඉටාගති.

"මගෙන් ඔබට උවමනා උපකාරය කුමක්ද ?" යි හේ ඇසීය.

"මට තද බඩගින්නක් හා තද සීතලක් දැනෙනවා. නමුත් කුඩා පරෙවියෙකු වන ඔබට කළ හැකි උපකාරය කුමක් ද?" දඩයක් කාරයා දුක් බරව උත්තර දුන්නේය.

ක්‍රිෂ්ණ ඉගිලී ගොස් ලී කෝටු ටිකක් ගෙනාවේය. ඊළඟට ඇවි ලෙන අඟුරු කැබලි කීපයක් ගෙනාවේය. මේ අඟුරු ලී කැබලි මත තබා ඉතා ඉක්මනට ගිනි ගොඩක් ගැසුවේය.

"මෙන්න දැන් හරි. ගිනි මැලය ළඟට ඇවිත් ගත උණුසුම් කර ගන්න. කැමක් නම් මා ළඟත් නැහැ. ඒත් අර කූඩුවේ හිර කරගෙන සිටින මගේ භාර්‍යාව වන ධාරිනී නිදහස් කර හරිනවා නම්, ඔබට මා ආහාරයට ගත හැකියි" ක්‍රිෂ්ණ කීය.

වෙන කළ හැකි දෙයක් නොමැති දඩයක්කාරයා කූඩුවේ දොර හැරි යේය. ඉවතට පැමිණි ධාරිනී ක්‍රිෂ්ණට කතා කොට "ඉක්මනින් එන්න, අපට බේරී යන්න පුළුවන්" යැයි කීවාය.

නමුත් ක්‍රිෂ්ණ කියන්නේ, "බැහැ, මා මගේ වචනය දඩයක්කාරයාට දී තිබේ. එය ඉෂ්ඨ කළ යුතුයි. ඔබ ප්‍රවේශම් නම් ඒ ප්‍රමාණවත්ය. ආයුබෝවන් ධාරිනී"

මෙසේ කිව් ඌ කෙළින්ම ගිනිගොඩ මැදට පියෑඹීය. උගේ ශරීරය ගිනිදැල්වලින් වට වෙද්දී, කඳුළු පිරි දෙනෙතින් යුත් ධාරිනී ද ගිනි ගොඩටම ඉගිලුනාය. පරෙවියෝ දෙදෙනම පිළිස්සී මළෝය. උන් දෙදෙනා එක්ව ප්‍රීතියෙන් ස්වර්ගයට ගියෝය.

විශ්මයටත්, කණගාටුවටත් පත් දඩයක්කාරයා ජීවිත පිදූ පෙම්බර පරෙවි ජෝඩුව ආහාරයට ගත්තේ නැත. ඉන් පසුව සතුන් නො මරණ බවට පොරොන්දු වෙමින් හේ ගිනි මැලයෙන් එම සිරුරු ඉවත් කළේය. ඉන්පසු පූජක වරයෙකු වූ ඔහු, ඔහුගේ ජීවිතය දෙවියන් වෙනුවෙන් ගත කළේය. පරෙවියන් විසින් කරන ලද පරාර්ථකාමී ජීවිත පූජාව, ආදරය හා නීති ගරුකත්වය පිළිබඳ පාඩම ඔහුට උගන් වන ලදී.

නිමි.